ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

**6 වන මට්ටම 2022/2023**

අවසාන පරීක්ෂණය **- 2023**

ළමා අයිතිවාසිකම් **- SNU6223/ESU4123**

කාලය- පැය තුනයි. **(03)**

දිනය - **2023.12.03** වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

**1** වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ ප්‍රධාන මූලධර්ම තුන **(03)** නම් කරන්න.

02. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ වර්ධනය හා සංවර්ධනය පිළිබඳ අයිතිය ආරක්ෂා කිරීම සඳහා පාසල සතු කාර්යයන් පහක් **(05)** ලියන්න.

03. ශ්‍රී ලාංකික ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීමට බ්‍රිතාන්‍යයන් විසින් ගනු ලැබූ අණපනත් පහක් **(05)** නම් කරන්න.

04. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මානසික අපයෝජනයෙන් ආරක්ෂා කර ගැනීමට පවුලට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග පහක් **(05)** යෝජනා කරන්න.

05. ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන භූමිකා තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පාසල තුළ දී විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ක්‍රීඩා හා විවේකය අහිමි වන අවස්ථා පහක් **(05)** ලියන්න.

07. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මව්වරුන් ඔවුන්ගේ සුරක්ෂණ අයිතිය ආරක්ෂා කිරීමේ දී මුහුණ දෙන ගැටලු පහක් **(05)** දක්වන්න.

08. පාසලේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගුරුවරුන් සතු වගකීම් පහක් **(05)** ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. “ශ්‍රී ලංකාවේ පූර්ව යටත්විජිත සමාජය ළමා අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය පිළිනොගත්ත ද ළමයින් ට රැකවරණය හා සෙනෙහස අහිමි වූ බවක් ඉන් අදහස් නොවේ.”

    (i) මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබගේ අදහස් සුදුසු උදාහරණ සමඟ දක්වන්න.

(ලකුණු 10)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන බවට තහවුරු කරනු පිණිස, නිදහසින් පසු ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබ ඇති ප්‍රධාන පියවර පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. "ළමා අයිතිවාසිකම් පදනම වී ඇති ප්‍රධාන මූලධර්මයක් වන්නේ වෙනස් ලෙස නොසැලකීමයි."

(i) වෙනස් ලෙස නොසැලකීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ පාසල්වල විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සම්බන්ධයෙන් එය උල්ලංඝනය වන අවස්ථා තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) නිදහසින් පසු වෙනස් ලෙස නොසැලකීමේ මූලධර්මය සුරැකීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති වැදගත් පියවර මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) ශ්‍රී ලංකාවේ විශේෂ තත්ත්වයේ පසුවන ළමයින්ගේ අයිතිවාසිකම් විභාග කරන්න. (ලකුණු 06)

(ii) එම දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අවම වශයෙන් යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(iii) එම යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී සමාජය මුහුණ දෙන අභියෝග ලැයිස්තු ගත කරන්න. (ලකුණු 08)

12. (i) දරුකමට හදා ගැනීම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් දරුකමට සාදා ගැනීමේ දී අනත් දරු නිවාස මුහුණ දෙන දුෂ්කරතා පහක් **(05)** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ දුෂ්කරතා අවම කර ගැනීමට සුදුසු යෝජනා පහක් **(05)** ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

13. "විශේෂ තත්ත්වයේ පසුවන ළමයින්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට උදව් කළ හැකි ය."

(i) විශේෂ තත්ත්වයේ පසුවන ළමයින් යනු කවුරුන් ද? (ලකුණු 04)

(ii) විශේෂ තත්ත්වයේ පසුවන ළමයින්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට උදව්විය හැකි ආකාරය තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත දැක් වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය නොවන සංවිධාන මුහුණ දෙන ගැටලු දෙකක් **(02)** සඳහන් කර ඒවා අවම කිරීමට සුදුසු යෝජනා දෙක **(02)** බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු10)

14. (i) විශේෂ තත්ත්වයන් සහිත ළමයින් පිළිබඳව ප්‍රජාවගේ දැනුවත් බව වැඩි දියුණු කිරීමට ජනමාධ්‍යයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) ඒවා ක්‍රියාත්මක කිරීමේ දී ජනමාධ්‍ය මුහුණ දෙන ගැටලු හතරක් **(04)** දක්වන්න.

(ලකුණු 08)

(iii) විශේෂ තත්ත්වයේ පසුවන ළමයින් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීමෙන් අත්වන වාසි මොනවාදැයි සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.